චක්‍රලේඛ අංක .34../2015

මගේ අංක : කේ5/5/විවධ/    /2015
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2015-12-21 වන දින

සියළුම බන්ධනාගාර අධිකාරීන්/සහකාර අධිකාරීවරුන් වෙත,

**රක්ෂණ භාරයට පත් කර ඇති රැඳවියන් සම්බන්ධයෙන් 1991 අංක 8 දරණ ''රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත'' යටතේ කටයුතු කිරීම.**

රක්ෂණ භාරයට පත් කර සිටින රැඳවියන් සම්බන්ධයෙන් උක්ත පනත යටතේ බන්ධනාගාර අධිකාරීවරුන්ට වෙත පනවා ඇති නියෝග ප්‍රකාරව කටයුතු සිදු නොවන බව 2015-09-16 වන දින පවත්වන ලද ''බන්ධනාගාර තදබදය අඩු කිරීම සඳහා පත් කර ඇති කාර්ය සාධක රැස්වීමේ දී'' සාකච්ඡාවට බඳුන් වීමෙන් අනතුරුව, එකී පනතේ විධිවිධාන යටතේ බන්ධනාගාර අධිකාරීවරුන්ට පැවරී ඇති බලතල අනුව ක්‍රියා කළ යුතු බවට එහිදී තීරණය කර ඇත.

1991 අංක 08 දරණ ''රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත'' කෙරේ සියලුම බන්ධනාගාර භාරව කටයුතු කරන අධිකාරී/ සහකාර අධිකාරීවරුන්ගේ අවධානය මින් යොමු කරවන අතර, එහි අංක 3(1), 3(2) සහ 3(3) වගන්ති යටතේ ලබා දී ඇති නියෝග ප්‍රකාරව රක්ෂණ භාරයේ සිටින සියළුම රැඳවියන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවට මින් නියෝග කරමි.

තවද රක්ෂණ භාරයට පත් කිරීමට අදාල හේතුව (අදාල වගන්තිය) සඳහන් නොවී ඇති අවස්ථාවල චූදිත රක්ෂණ භාරයේ තැබීමට අදාල විස්තර ඒ තැනැත්තා රක්ෂණ භාරයට පත් කළ අධිකරණයෙන් ලබා ගැනීමට ඉහත කී පනතේ 7(2) මගින් අධිකාරීවරුන්ට ලබා දී ඇති බලතල යටතේ ක්‍රියා කළ යුතු බව දන්වමි.

මේ අනුව කටයුතු කිරීම මත සෑම මාසයක් තුළ රක්ෂණ භාරයෙන් මුදා හරින රැඳවියන්ගේ නම්, අංක, අධිකරණය, නඩු අංකය, රක්ෂණ භාරයෙන් මුදා හල දිනය ඇතුළත් විස්තර වාර්තාවක් ඊළඟ මාසයේ 10 වන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) වෙත ඉදිරිපත් කළ යුතුය.

1991 අංක 08 දරණ ''රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනතේ'' ඡායාස්ථ පටපතක් ද මෙයට අමුණා ඇත.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.